Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

Provincial Department of Education

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 10 - 2020

පුරවැසි අධ්‍යාපනය - පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 3 | 21. | 4 | 31. | 1 |
| 02. | 1 | 12. | 4 | 22. | 2 | 32. | 1 |
| 03. | 3 | 13. | 2 | 23. | 1 | 33. | 1 |
| 04. | 4 | 14. | 1 | 24. | 3 | 34. | 2 |
| 05. | 2 | 15. | 4 | 25. | 3 | 35. | 4 |
| 06. | 1 | 16. | 2 | 26. | 3 | 36. | 4 |
| 07. | 3 | 17. | 2 | 27. | 1 | 37. | 1 |
| 08. | 3 | 18. | 4 | 28. | 3 | 38. | 2 |
| 09. | 4 | 19. | 2 | 29. | 4 | 39. | 2 |
| 10. | 3 | 20. | 1 | 30. | 4 | 40. | 3 |

## II කොටස

(01) (i)
- ජනාධිපතිවරණය
- මහාමැතිවරණය
- පළාත් සභා මැතිවරණය
- පළාත් පාලන මැතිවරණය

(ii)
- එක්සත් ජාතික පක්ෂය
- ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
- ජනතා විමුක්ති පෙරමුණ
- ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
- දෙමළ ජාතික සන්ධානය
- ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය
- කදුරට ජනතා පෙරමුණ ආදි වශයෙන්.

(iii)
- භූමිය
- ජනගහනය

(iv)
- නිතර රැස්වීම හා සාකච්ඡා කිරීම.
- සමගිව රැස්වීම, සමගිව සාකච්ඡා කිරීම, සමඟිව විසිර යාම.
- නොපැන වූ නීති නොපැනවීම, පැන වූ නීති නොපිරිහෙලා ක්‍රියාත්මක කිරීම, ඒවා පිළිපැදීම.

(v)
- ජන සමාජයක පවත්නා ජන වර්ගය, භාෂාව, කුලය වැනි භේද නොසලකා සියල්ලන්ගේ මතය නියෝජනය වන පරිදි නියෝජිතයන් තෝරා පත් කර ගැනීමට අවස්ථාව ලැබීම.
- දේශපාලන ක්‍රියාවලිය පවත්වාගෙන යාමට අවශ්‍ය වන නායකයන් ප්‍රාදේශිය මට්ටමෙන් බිහි කර ගැනීමට අවස්ථාව ලැබීම.
- ඡන්ද කොට්ඨාසයට වගකියන නියෝජිතයෙකු තෝරා පත්කර ගැනීමට ජනතාවට අවස්ථාව ලැබීම.
- ප්‍රාදේශීය සංවර්ධනයට ඉඩ ප්‍රස්තා සැලසීම.

(vi)
- නීතිමය යුතුකම්
- සදාචාරාත්මක යුතුකම්

(vii)
- ඒකීය / සන්ධීය

(viii)
- කැබිනට් / ජනාධිපති

(ix)
- නියමිත කාල සීමාව තුළ මැතිවරණ පැවැත්වීම.
- නියමිත සුදුසුකම් සපුරා ඇති පුරවැසියන්ට ඡන්ද දායකත්වය / අපේක්ෂකත්වය ලැබීම
- නිදහසේ මැතිවරණ කටයුතුවලට සහභාගී වීමට ඇති අයිතිය තහවුරු වීම.
- මැතිවරණ නීති රීතිවලට අනුකූලව මැතිවරණ පැවැත්වීම.
- සාමකාමී වාතාවරණයන් තුළ මැතිවරණ පැවැත්වීම.

(x) ● සාකච්ඡා මගින් තීරණවලට එළඹීම.
● විරුද්ධ මත ඉවසීම.
● බහුතර මතයට ගරු කිරීම.
● සහයෝගයෙන් කටයුතු කිරීම.
● නීති ගරුකවීම ආදි වශයෙන්. (පි. 29)

02. (i) පිළිතුරට අනුව
(ii) ● වර්තමාන රාජ්‍ය භූමි ප්‍රමාණයන් විශාල වීම.
● වර්තමාන රාජ්‍ය අධික ජනගහනයෙන් සමන්විත වීම.
● සියලු පුරවැසියන් එක් ස්ථානයකට රැස් කිරීමේ අපහසුව.
● සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම.
(iii) ● එය මහජන කැමැත්ත මත සිදුවන නිසා ය.
● පාලනය සඳහා නියෝජිතයන් තෝරා ගනු ලබන්නේ මහජනතාවගේ බහුතර කැමැත්ත අනුව ය.
● ආණ්ඩු බලය හිමිවන්නේ ජනතා ඡන්දයෙන් වැඩි නියෝජිත පිරිසක් තේරී පත් වූ පක්ෂයට හෝ කණ්ඩායමටයි.
● නීති සම්පාදනය කරන්නේ මහජන ඡන්දයෙන් පත් වූ නියෝජිතයන්ගේ බහුතර කැමැත්ත අනුව ය.

03. (i) ● සරල බහුතර නියෝජන ක්‍රමය හා සමානුපාතික නියෝජන ක්‍රමය.
(ii) ● ඒක පක්ෂ ක්‍රමය
● බහු පක්ෂ ක්‍රමය
● ද්වි පක්ෂ ක්‍රමය
(iii) ● ජන මතය නියෝජනයට ඇති ඉඩකඩ පුළුල් වීම.
● අත්තනෝමතික පාලනයක් බිහි වීම වැළැක්වීම.
● ආණ්ඩු පක්ෂයේ අහිතකර ප්‍රතිපත්ති විවේචනය කිරීම තුළින් ඒවා නිවැරදි කර ගැනීමට අවස්ථාව සැලසීම.
● ජන සමාජයේ පවතින විවිධත්වය නිරූපණය වීමට අවස්ථාව සැලසීම.
● බහුවිධතාවය තුළින් එක්සත්බව ගොඩනැගීම.

04. (i) ● කුරුණෑගල / පුත්තලම
(ii) ● ආණ්ඩුවේ ප්‍රධාන ආයතන වන ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය නිර්මාණය වන ආකාරය
● එම ආයතනවල කාර්යභාරය, බලතල හා එම ආයතන අතර පවත්නා සබඳතාවයන්හි ස්වරූපය.
● ආණ්ඩුව හා පුරවැසියා අතර පැවතිය යුතු සම්බන්ධතාවයන්හි ස්රූපය.
● පුරවැසියන් සතු මූලික අයිතිවාසිකම්.
● ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. සම්බන්ධයෙන් වන විධිවිධාන.
(iii) ● පාලනයේ ක්‍රමවත්බව හා ස්ථාවර බව ආරක්ෂා වීම.
● පුරවැසි අයිතිවාසිකම් පිළිබඳව පාලක / පාලිත දෙපක්ෂය දැනුවත් වීම.
● පාලකයන් අත්තනෝමතික ලෙස ක්‍රියා කළහොත් එය වළක්වා ගත හැකි වීම.
● අධිකරණයේ ස්වාධීනත්වය සුරක්ෂිත වීම.
● මූලික අයිතිවාසිකම් සුරක්ෂිත වීම.
● නීතියේ රැකවරණය සැමට සමානව ලැබීම.
● ආණ්ඩුක්‍රමයට සම්බන්ධ ආයතනවලින් රට වැසියන්ට සිය අවශ්‍යතා සිතුම් පැතුම් ඉටු කර ගත හැකි වීම.

05. (i) ● නිකලොයි මැකියාවලි, ජීන් බොඩෑන්, තෝමස් හොබ්ස්
(ii) ● එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් යන සංකල්පය මත පදනම් වීම.
● භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපති බලය යන අංගයන්ගෙන් සමන්විත වීම.
● වෘත්තීය නිලබල පැලැන්තියක් මඟින් පාලන බලය මෙහෙයවීම.
● අභ්‍යන්තර හා බාහිර කටයුතු සම්බන්ධයෙන් ස්වාධිපති බලය හිමි වීම.
(iii) ● භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍යය

06. (i) ● මහාචාර්ය ගානර්
(ii) ● ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය
(iii) ● නීතිය හා සාමය ආරක්ෂා කිරීම.
● සමානාත්මතා මූලධර්මය ආරක්ෂා කිරීම
● ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම.
● නීතියේ සාධාරණත්වය සුරක්ෂිත කිරීම. (පි. 25)

07. (i) ● නාමික විධායකය
● දේශපාලන විධායකය / සත්‍ය විධායකය
(ii) ● මෙය නාමික විධායකය හා සත්‍ය විධායකය යන අංග දෙකකින් සමන්විත වේ.
● ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත් වීම.
● ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සෘජු සම්බන්ධයක් පවතී.
● විධායකය සිය කටයුතු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයට සාමූහිකව බැඳී සිටීම.
● විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකියාව තිබේ.
(iii) ● විධායකය හසුරුවනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි.
● රාජ්‍ය නායකයා මෙන් ම ආණ්ඩුවේ නායකයා ද වන්නේ ජනාධිපතිවරයා ය.
● විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී නැත.
● ව්‍යවස්ථාදායකය මගින් සෘජුව විධායකය පාලනය කිරීමක් සිදු නොවේ.